සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 13 - 2023**

විභාග අංකයඃ ..................................

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

කාලය පැය 02 යි

- **අංක 01 - 50 දක්වා එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

---

(01) ශ්‍රී ලංකාව තුළ පාසල් විෂය මාලාවට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය ඇතුළත් කිරීමේදී ප්‍රමුඛ දායකත්වයක් සැපයූ ආයතනය කුමක්ද?

(1) එක්සත් ජාතීන්ගේ සංවිධානය. (2) යුනිස්කෝ සංවිධානය
(3) පොදුරාජ්‍ය මණ්ඩලය (4) යුනිසෙෆ් ආයතනය
(5) රතුකුරුස සංවිධානය (......)

(02) සන්නිවේදකයා ආයතනගත ස්වරූපයක් නිරූපණය කරන ආකෘතිය වන්නේ.,

(1) හැරල් ඩී ලැස්වෙල් ආකෘතිය. (2) ඩේවිඩ් කේ බර්ලෝ අකෘතිය.
(3) ෂැනොන් හා වීවර් ආකෘතිය. (4) විල්බර් ග්‍රාම් ආකෘතිය.
(5) ඇරිස්ටෝටල් ආකෘතිය. (......)

(03) පුද්ගලයෙකුගේ සිත තුළ හට ගන්නා අදහස් සිතුවිලි ආදිය සංකේත ඇසුරෙන් පණිවිඩයක් බවට පරිවර්තනය කිරීම හඳුන්වන්නේ,

(1) ආකේතිකරණය යි. (2) ආකේතකරයයි.
(3) විකේතිකරණය යි. (4) විකේතකරයයි.
(5) සංකේතකරණය යි. (......)

(04) විද්‍යුත් සන්නිවේදන ක්‍රියාවලියකදී බාධකයක් නොවන්නේ,

(1) ගුවන් යානයක ඉහළින් පියාසර කිරීමය.
(2) පරිසරයේ අධික උෂ්ණත්වය හා ආර්ද්‍රතාවයය.
(3) ග්‍රාහකයාගේ අසනීප තත්ත්වයය.
(4) මාධ්‍යමය දැනුම නොමැති වීමය.
(5) ආවරණ කලාපය තුළ සිටීමය. (......)

(05) සන්නිවේදන ක්‍රියාවලිය තුළ"එහි ව්‍යුහාත්මක ස්වරූපය හඳුනා ගත හැකි මූලිකාංග වන්නේ,

(1) සන්නිවේදකයා, සන්දේශය, මාධ්‍ය (2) තොරතුරු මූලාශ්‍ර , සන්නිවේදකයා, ග්‍රාහකයා.
(3) සන්නිවේදකයා, බාධක, ග්‍රහකයා (4) සන්නිවේදකයා, මාධ්‍ය, ප්‍රතිපෝෂණය.
(5) සන්නිවේදකයා, සංදේශය, ග්‍රාහකයා (......)

(06) සන්නිවේදන ක්‍රියාවලියේ දී සංඥා පද්ධතියක් පැවතීම යනු,

(1) සන්නිවේදනය සඳහා අවශ්‍යම කොන්දේසියකි.
(2) සන්නිවේදන ක්‍රියාවලියේ යාන්ත්‍රික පදනම ප්‍රකාශ කරන්නකි.
(3) සන්නිවේදනය සඳහා අත්‍යවශ්‍යම සාධකයක් නොවන්නකි.
(4) සන්නිවේදන ස්වරූපයට අදාළ වන්නකි.
(5) සන්නිවේදන මූලිකාංගයකි. (......)

(07) කණ්ඩායමක් තුළ විසම්මුතියට ඉඩ නො ලැබෙන්නේ කුමන සාධකය නිසාද ?

(1) නිදහස් මතධාරී පුද්ගලයන් සිටීමෙනි.
(2) පාලනය කරන ලද පුද්ගලයන් සිටීමෙනි.
(3) විවිධ මත දරන පුද්ගලයන් සිටීමෙනි.
(4) ප්‍රජාතන්ත්‍රවාදී මත දැරීමෙනි.
(5) සාධනීය ලෙස අදහස් සාකච්ඡා කිරීමෙනි. (......)

(08) මානව සන්නිවේදන ඉතිහාසයෙහි ආරම්භක සන්නිවේදන ස්වරූප දෙක මොනවාද?

(1) වාචික හා අවිධිමත් (2) විධිමත් හා අවිධිමත්
(3) ශ්‍රව්‍ය හා වාචික (4) දෘශ්‍ය හා අවාචික
(5) ලිඛිත හා දෘශ්‍ය (......)

(09) ග්‍රාහකයා පිළිබඳ වඩාත් සදොස් ප්‍රකාශය වන්නේ,

(1) දෙදෙනෙකු නොමැති තැන ග්‍රාහකයකු නොසිටීමයි.
(2) ග්‍රාහක භූමිකාව ස්ථිරව පැවැතීමයි.
(3) ග්‍රාහකයා සැමවිටම අර්ථකථනය කිරීමෙහි කුසලතා පැවතීමයි.
(4) ග්‍රාහක සාක්ෂරතාවය සම මට්ටමේ නොපැවැත්වීමයි.
(5) ග්‍රාහකයාගේ වින්දන ක්ෂේත්‍රය පුළුල්ව පැවැතීමයි. (......)

(10) පොදුජන රටාව සඳහා අවශ්‍ය හර පද්ධතිය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ මාධ්‍ය මෙහෙවර අදාළ වන්නේ,

(1) ප්‍රචාරණයටයි. (2) ස්වසංකල්පයටයි.
(3) සමාජානුයෝජනයටයි. (4) සහානුභූතියටයි.
(5) සංජානනයටයි. (......)

(11) නිවේදකයාගේ වැඩසටහන ඉදිරිපත් කිරීමේ ස්වරූපය නිසා ඊට සාවදානව සවන් දීමට යොමු වූ අජිත් එම වැඩසටහන් කෙරෙහි බැඳී ගියේ ය එහි වූයේ,

, (1) නිවැරදි ආකේතනය නිසාය. (2) නිවේදකයාගේ ආචාරශීලී බව නිසාය.
(3) ග්‍රාහකයා සහානුභූතියට පත්වීම නිසාය. (4) අර්ථ බාධක හා මාධ්‍ය බාධක අවම නිසාය.
(5) අජිත්ගේ ග්‍රාහක හැකියාව උසස් නිසාය. (......)

(12) සන්නිවේදන ක්‍රියාවලියේ සාර්ථකත්වය මැන බලන මූලිකාංගය වන්නේ,

(1) සන්නිවේදකයා. (2) ග්‍රාහකයා. (3) බලපෑම
(4) ප්‍රතිපෝෂණය. (5) බාධක (......)

(13) තොරතුරු සම්පාදනය පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක්වේ

A - සමාජයීය පැවැත්මට තොරතුරු අවශ්‍ය වේ.
B - ශරීරයට ආහාර මෙන් මනසට තොරතුරු අවශ්‍යයි.
C - තොරතුරක ප්‍රධාන වශයෙන් විශ්වාසනීයත්වය තිබිය යුතුය.
D - අවිධිමත් තොරතුරු ද සමාජයේ පැවැත්මට හේතුවේ.
E - ජනමාධ්‍යටත් වඩා වේගයෙන් නව මාධ්‍ය ඔස්සේ සමහර තොරතුරු ලැබේ.

(1) A,B,C නිවැරදි වෙයි D,E වැරදිය. (2) A,B,C,E නිවැරදි වෙයි D වැරදිය.
(3) B,C,E නිවැරදි වෙයි A,D වැරදිය. (4) A,B,C ,D,E සියල්ලම නිවැරදි වෙයි.
(5) A,C,D,E නිවැරදි වෙයි B වැරදිය. (......)

(14) පැරණි ජනශ්‍රුතිවල මනඃකල්පිත සත්ව චරිත නිර්මාණය වී ඇත්තේ.

(1) ආගමික විශ්වාසයෙන් අර්ථ ගැන්වීමට ය.
(2) විශේෂ සමාජ චර්යා බලවේග සංකේතවත් කිරීමටය.
(3) කතන්දර කියාදීමේදී ත්‍රාසය හා කුතුහලය පවත්වා ගැනීමටය.
(4) ජනතාවගේ සුවිශේෂ අපේක්ෂාවන් සාක්ෂාත් කිරීමටය.
(5) ජන සාහිත්‍යයේ සුවිශේෂ අවශ්‍යතාව පවත්වා ගැනීමටය. (......)

(15) කිසියම් මාධ්‍යයක් සඳහා භාවිතා කරන භාෂාවක ලක්ෂණ පහත දැක්වේ.

A - පරිභාෂිත වචන භාවිතය අඩුය.

B - ව්‍යාකරණ දෝෂ රහිත නිවැරදි බසක් විය යුතුය.

C - සරල සුගම භාෂාවක් විය යුතුය.

ඉහත ලක්ෂණ සහිත භාෂාව වඩාත් ගැලපෙන්නේ,

(1) පුවත්පත් මාධ්‍යටය (2) ගුවන් විදුලි මාධ්‍යයටය

(3) නව මාධ්‍යට ය (4) රූපවාහිනී මාධ්‍යයටය

(5) සිනමා මාධ්‍යයටය. (......)

(16) නව ලිබරල් වාදය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) ගෝලීයකරණය නිසා බිහි වූවකි.

(2) නව ලිබරල්වාදයේ පදනම ගෝලීයකරණයයි.

(3) බටහිර යුරෝපා ව්‍යාපාරික ආධිපත්‍යය මුල් කරගෙන ඇත.

(4) ජාතික ආර්ථික ස්වාධීනත්වය හා සමීපව බැඳී තිබේ.

(5) නව ලිබරල් වාදය පවත්වාගෙන යාම මාධ්‍ය සංස්කෘතියේ ප්‍රධාන භූමිකාවයි. (......)

(17) ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ ඉදිරිපත් වූ මත කිහිපයක් පහත දැක්වේ,

A - සෑම සමාජ පන්තියක්ම ආකර්ෂණය කර ගනී

B - කල් පවත්නා ස්වභාවයකින් යුක්ත වේ.

C - ජනමාධ්‍ය මත ව්‍යාප්ත වේ.

D - නිෂ්පාදන අතිරික්තයක් ඇත.

E - නිර්මාණශීලීත්වයෙන් යුක්තය.

ඉහත ප්‍රකාශ අතරින්,

(1) A,D සත්‍ය වන අතර B,C,E අසත්‍ය වේ. (2) A,B සත්‍ය වන අතර C,D,E අසත්‍ය වේ.

(3) A,C,D සත්‍ය වන අතර B,E අසත්‍ය වේ. (4) A,C,E සත්‍ය වන අතර B,D අසත්‍ය වේ.

(5) A,B,E සත්‍ය වන අතර C,D අසත්‍ය වේ. (......)

(18) වර්තමාන සමාජයේ බොහෝ දෙනා කාල වේලාව නොමැති බව කියමින් එදිනෙදා කටයුතු අතපසු කර ගනිති. මෙසේ වීමට ආසන්නතම හේතුව ලෙස ඔබ දකින්නේ,

(1) පෞද්ගලික කටයුතු අධික වීමයි.

(2) රාජකාරි කටයුතු අධික වීමයි.

(3) ජනමාධ්‍යට අනුව දෛනික න්‍යාය පත්‍රයක් සකස් කර ගැනීමයි.

(4) අධ්‍යාපනයේ අවශ්‍යතාවය දැන්වීමයි.

(5) පුද්ගල ආර්ථික සංවර්ධනයට මුල්තැන දීමයි. (......)

(19) ගෝලීයකරණ සන්දර්භය තුළ ජනමාධයේ ලක්ෂණයක් නොවන්නේ,

(1) එකම පණිවිඩයක් විවිධත්වයෙන් යුත් ග්‍රාහක කණ්ඩායම කට යොමු කිරීම.

(2) සාපේක්ෂ වශයෙන් අක්‍රීය පාරිභෝගික කණ්ඩායමක් දක්නට ලැබීම.

(3) පොදු අවශ්‍යතා වලට වඩා පුද්ගල අනන්‍යතා සඳහා ප්‍රමුඛත්වය හිමි වීම.

(4) පවත්නා සමාජ රටාව ස්වභාවික තත්ත්වයක් බව මහජනයාට පිළිගැනීමට සැලැස්වීම.

(5) සමාජයේ බල රහිත වූවන් නිහඬ කරවීම හා ප්‍රවණතාවයක් පැවතීම. (......)

(20) විද්‍යුත් මාධ්‍ය ළමා මනසට වඩාත් අයහපත් බලපෑමක් සිදු කරන්නේ,

(1) විස්තෘත පවුල් සංස්කෘතිය තුළ ය.

(2) ඒකීය පවුල් සංස්කෘතිය තුළ ය.

(3) නාගරික පවුල් සංස්කෘතිය තුළ ය.

(4) මුඩුක්කු ජනාවාස පවුල් සංස්කෘතිය තුළ ය.

(5) බහු විවාහ පවුල් සංස්කෘතිය තුළ ය. (......)

(21) පහත සඳහන් ප්‍රකාශ අතරින් සදොස් ප්‍රකාශය තෝරන්න.

(1) මාධ්‍ය විචාරය සඳහා මාධ්‍ය නිර්මාණ සමාජගත වීමේදී ලබාගන්නා ප්‍රමාණාත්මක ප්‍රතිචාරයන් සැලකිල්ලට ගනු ලැබේ.

(2) මාධ්‍ය විචාරය සංසන්දනාත්මකව මෙන්ම විශ්ලේෂණාත්මකව සිදු කළ හැකිය.

(3) මාධ්‍ය විචාර ක්‍රියාවලිය මාධ්‍ය නිර්මාණ ක්‍රියාවලියෙන් පරිබාහිර පවතින්නකි.

(4) මාධ්‍ය විචාරකයා ගේ වගකීම විය යුත්තේ මාධ්‍ය නිර්මාණකරුට විවේචනාත්මකව සහය සැලසීමයි.

(5) මාධ්‍ය විචාරය අක්‍රිය වූ පරිසරයක මාධ්‍ය භාවිතයෙන් අයාලේ ගමන් කිරීම වැළැක්විය නොහැක.

(......)

(22) මාධ්‍ය සාක්ෂරතාව සම්බන්ධයෙන් ඉදිරිපත් වූ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - මාධ්‍ය සාක්ෂරතාවයේ පදනම ලිවීමට හා කියවීමට ඇති හැකියාවයි.

B - මාධ්‍ය සාක්ෂරතාව වැඩිපුර අදාළ වන්නේ මුද්‍රිත මාධ්‍ය සම්බන්ධයෙනි.

C - මාධ්‍ය අන්තර්ගතය තේරුම් ගෙන පරිහරණය කිරීම මාධ්‍ය සාක්ෂරතාව යයි.

D - සන්දේශ නිර්මාණය හා ඇගයීම මාධ්‍ය සාක්ෂරතාවයෙහි අංගයක් වෙයි.

ඉහත ප්‍රකාශ අතුරෙන්.

(1) A පමණක් සත්‍ය වේ.
(2) B පමණක් සත්‍ය වේ.
(3) C පමණක් සත්‍ය වේ.
(4) AB සත්‍ය නමුත් CDඅසත්‍ය වේ.
(5) ABඅසත්‍ය නමුත් CDසත්‍ය වේ. (......)

(23) දැන්වීම්කරණය අහිතකර මාධ්‍ය සංස්කෘතියක් නොවන්නේ,

(1) දැන්වීම් නිසා භාණ්ඩ වල මිල අසීමිතව ඉහළ යන විටදී.
(2) අවිචාර පාරිභෝජනයට තල්ලු කරන විටදීය.
(3) තෝරා බේරා ගැනීම ගැටලුකාරී වන විටදී.
(4) සමාජ අලෙවිකරණ දැන්වීම් බහුල වන විටදීය.
(5) දැන්වීම් සඳහා අය කරන ගාස්තු ඉහළ යන විට දී ය. (......)

(24) ගෝලීය සංස්කෘතිය නිර්මාණය වීමට සන්නිවේදන මාධ්‍ය හා බැදෙමින් සූක්ෂම භූමිකාව ඉටු කරන්නේ,

(1) බහු ජාතික සමාගම් විසිනි.
(2) ජනමාධ්‍ය ආයතන විසිනි.
(3) අධිරාජ්‍යවාදී රාජ්‍යයන් විසිනි.
(4) දැන්වීම් ආයතන විසිනි.
(5) රාජ්‍ය නොවන සංවිධාන විසිනි. (......)

(25) මාධ්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමෙන් අපේක්ෂා කරන සමාජයීය ඵලයක් වන්නේ,

(1) ග්‍රහකයන් ගේ ඉහළ වරණ හැකියාවයි.
(2) සැඟවුන න්‍යාය පත්‍රය හඳුනාගැනීමේ හැකියාවයි.
(3) එක් එක් මාධ්‍යයන්ගේ ව්‍යරණ වටහා ගැනීමයි.
(4) ජනමාධ්‍යයට වඩා හිතකර මාධ්‍ය සංස්කෘතියක් ගොඩ නැගීමයි.
(5) වඩා පරිණත මාධ්‍ය වෘත්තිකයන් බිහි කිරීමයි. (......)

(26) නිර්මාණශීලී චින්තනය නිර්මාණයශීලී භාෂා භාවිතයේ අග්‍ර ඵලයයි. මිනිසා භාෂාව නිර්මාණය කරගැනීම මගින් ලද විශිෂ්ට දායාදයක් නොවන්නේ,

(1) මිනිසාට සංවිධානය වීමේ හැකියාව.
(2) සත්‍ය වෙනුවෙන් පෙනී සිටීමේ හැකියාව.
(3) තර්කානුකූලව යමක් වටහා ගැනීමේ හැකියාව.
(4) මතකයේ තැන්පත් කර ගැනීමේ සහ අවශ්‍ය විටක මතක් කර ගැනීමේ හැකියාව.
(5) ලිඛිත භාෂාව ඔස්සේ දැනුම ගබඩා කිරීමේ සහ දැනුම කියවා වටහා ගැනීමේ හැකියාව (......)

(27) නිර්මාණාත්මක ජන කලා වලට අයත් වන්නේ,

A - සම්ප්‍රදායික චිත්‍ර.
B - මූර්ති.
C - බීරලු
D - කැටයම්.
E - බලි ශාන්තිකර්ම.

(1) ABC පමණය
(2) ABD පමණය
(3) CDE පමණය
(4) AD පමණය
(5) ඉහත සියල්ලම අයත්වේ (......)

(28) අති දුර රූප රාමුවක් මගින් ප්‍රකාශ කරන්නේ,

(1) අරමුණ කුමන සන්දර්භයක පිහිටා ඇත්ද යන්නයි.
(2) අරමුණ කුමන ක්‍රියාවක නිරත වී ඇත්ද යන්නයි.
(3) අරමුණේ මුහුණේ ඉරියව් පිළිබඳවයි.
(4) අරමුණ කුමන හැඟීමකින් සිටිනවාද යන්නයි.
(5) අරමුණේ අන්තර් මනෝභාවයක් පිළිබඳවයි. (......)

(29) සිනමා පටයක් සම්පූර්ණ කිරීම සඳහා අත්‍යවශ්‍ය අංග වන්නේ

(1) තිර පිටපත, කැමරාකරණය, අධ්‍යක්ෂණය, සංස්කරණය.
(2) තිරක්ෂාව, තිර පිටපත, කැමරාකරණය, අධ්‍යක්ෂණය
(3) තිර පිටපත, කැමරාකරණය, අධ්‍යක්ෂණය, දෙබස් කැවීම.
(4) තිර පිටපත, කැමරාකරණය, සංගීතය, අධ්‍යක්ෂණය.
(5) තිර කතාව, කැමරාකරණය, අධ්‍යක්ෂණය, සංස්කරණය. (......)

(30) නිර්මාණාත්මක සන්නිවේදකයකුට නිර්මාණ ස්වීයත්වය පවත්වා ගැනීමේ ඉඩකඩ උපරිමව භුක්ති විඳිය හැක්කේ,

(1) ගුවන්විදුලි පිටපත් රචනයේදී.
(2) සිනමා තිර තිරනාටක රචනයේ දී
(3) වේදිකා නාට්‍ය පෙළ රචනයේදී
(4) කෙටිකතා රචනයේ දී.
(5) වෙළෙඳ දැන්වීම් පිටපත් රචනයේදී. (......)

(31) නිර්මාණ කරණයට අදාළ වස්තු විෂය උකහා ගන්නා මූලික ක්‍රමවේද ත්‍රිත්වය වන්නේ,

(1) ප්‍රජානනය, ප්‍රතිසංවේදනය හා ප්‍රත්‍යක්ෂණය.
(2) තමාගේ, අන්‍යන්ගේ හා මාධ්‍ය ආශ්‍රිත අත්දැකීමයි.
(3) ආත්ම භාෂණය, පරිකල්පනය, ව්‍යුත්පන්තිය.
(4) සංවේදනය, ප්‍රත්‍යක්ෂණය, සතතාභ්‍යාසය.
(5) ස්ව අත්දැකීම්, පරිකල්පනීය අත්දැකීම් හා සමාජානුයෝජනය (......)

(32) මහජන සම්බන්ධතා ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණු අයත් කාණ්ඩය වන්නේ,

A - ආයතනයට මහජනයා ගෙන්වාගැනීම.
B - ගෙන්වාගත් මහජනයා තුළ සුබවාදී ආකල්පයක් ඇති කිරීම.
C - තම භාණ්ඩ හා සේවා පිළිබඳ ඉහළ ප්‍රචාරණයක් ලබා දීම.
D - මහජනයා ආයතනය තුළ රඳවා ගැනීමට උත්සාහ කිරීම.
E - සේවාලාභීන්ට ඉහළ සේවයක් ලබා දීම.

(1) ACD පමණි
(2) CDE පමණි
(3) ABD පමණි
(4) ඉහත සියල්ලම.
(5) ඉහත කිසිවක් නොවේ. (......)

(33) ඔබ සේවය කරන ආයතනයේ හදිසි මූල්‍ය අර්බුදයකට ලක් වූයේ නම් මහජන සම්බන්ධතා නිලධාරියා වශයෙන් ඔබ නොකල යුතු කාර්යයක් වන්නේ,

(1) තත්ත්වය පිළිබඳව සුදුසු මාධ්‍යයන් යොදාගෙන පාරිභෝගිකයන් දැනුවත් කිරීම.
(2) අභ්‍යන්තර සේවකයන් අතර සාමය පවත්වාගෙන යාමට කටයුතු කිරීම.
(3) නිලලත් පාර්ශ්වයන්ට තත්ත්වය පැහැදිලි කර දීම.
(4) හැකි සෑම විටම මහජනයාගෙන් තත්වය වසන් කර තබා ගැනීම.
(5) සුදුසු විශේෂඥ කණ්ඩායමකට විමර්ශන කටයුතු භාර දීම. (......)

(34) ඔබ ආයතනයක සිද්ධි කළමනාකරුවකු නම් ඔබ නොකළ යුත්තේ,

(1) මහජන කණ්ඩායම් වලට ප්‍රතිචාර දැක්වීම. (2) අයවැය පිළිබඳ සැලකිලිමත් වීම..
(3) කාල කළමනාකරණය. (4) නිර්මාණාත්මක භාවය
(5) හදිසි වෙනස්කම් පිළිබඳ සවිඥානික භාවය. (......)

(35) අප රටේ මෑතක දී ඇති වූ වසංගත රෝග අවස්ථාවේදී ජනතාව වෙත සහනාධාර එක්රැස් කර බෙදා දීමට ජනමාධ්‍ය ආයතන විසින් කටයුතු කරන ලදී. ආයතන දෘෂ්ටි කෝණයෙන් බලන විට මෙය.

(1) ජනමාධ්‍යයේ ප්‍රමුඛ කාර්යයකි.
(2) ආපදා කලමණාකාර ක්‍රියාවලියකි.
(3) ප්‍රජා සත්කාරයකි.
(4) මහජන සම්බන්ධතා ස්වරූපයකි.
(5) මාධ්‍ය සමාජ වගකීම ඉටු කිරීමකි. (......)

(36) ජනමාධ්‍ය ප්‍රවෘත්ති නිෂ්පාදන ක්‍රියාවලියෙහිලා මහජන සම්බන්ධතා ආයතන වල දායකත්වය ඉහළ යමින් පවතී. මෙම ප්‍රකාශය මඟින් ගම්‍ය වන්නේ,

(1) මහජන සම්බන්ධතා ආයතන ප්‍රවෘත්ති මූලාශ්‍ර ලෙස කටයුතු කරන බවයි.
(2) මහජන සම්බන්ධතා ආයතන ප්‍රවෘත්ති වාර්තාකරුවන් පුහුණු කරන බවයි.
(3) ප්‍රවෘත්ති රචනයේදී මහජන සම්බන්ධතා මූලධර්ම අනුගමනය කරන බවයි.
(4) ජනමාධ්‍ය ප්‍රවෘත්ති අංශ ක්‍රියාකාරීත්වය සීමා වෙමින් පවතින බවයි.
(5) ප්‍රවෘත්ති නිෂ්පාදන ක්‍රියාවලියට "දැන්වීම්කරණය දායක වන බවයි. (......)

(37) සිල්වියෝ වයිස්බෝඩ් සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳ ප්‍රකාශ කළ අදහස් අතර අයත් නොවන ප්‍රකාශය වන්නේ,

(1) පුද්ගලාන්තර සන්නිවේදනය හා ජන සන්නිවේදනය අතර "අසමතුලිතතාවය පෙන්වා දීමයි.
(2) ඉහල පහල හා පහල ප්‍රවේශ ඒකාබද්ධ කිරීම.
(3) සන්නිවේදන මෙවලම් භාවිත කිරීම.
(4) කේන්ද්‍රගත බලය ශක්තිමත් කිරීම.
(5) පුද්ගල හා සමාජ හැසිරීම් වෙනස් කිරීම. (......)

(38) එක්තරා ගොවිපලක වගාවන්ට බෝ වූ කෘමි උවදුරක් මර්දනය කිරීමේදී කෘෂිකර්ම නිලධාරීන් හට අනුගමනය කළ හැකි වඩාත් සාධනීය ක්‍රියාමාර්ගය වන්නේ,

(1) ජනමාධ්‍ය ඔස්සේ සාකච්ඡාමය වැඩසටහන් ඉදිරිපත් කිරීමය.
(2) උපදෙස් සහිත පොත් පිංචක් මුද්‍රණය කිරීම ය.
(3) නිවේදන හා පත්‍රිකා මගින් දැනුවත් කිරීම ය.
(4) ක්ෂේත්‍ර හමුවීම් හා උපදේශාත්මක සාකච්ඡා පැවැත්වීම ය.
(5) සංවාද මණ්ඩපයක් සැලසුම් කිරීම ය. (......)

(39) රටක තිරසර සංවර්ධනය යන්නෙන් අර්ථ ගැන්වෙන්නේ

(1) මුළුමනින්ම කෘෂිකර්මාන්තයෙන් ස්වංපෝෂිත කිරීමකි.

(2) ගොඩනැගිලි හා මහා මාර්ග හැකිතරම් ඉදිකිරීමකි.

(3) පරිසරය හා ගැලපෙන ක්‍රියාවලියකි.

(4) ප්‍රවාහනය සන්නිවේදනය හා සංචාරක සේවා දියුණු කිරීමකි.

(5) ගෝලීයකරණයට උචිත පරිදි රටක ආර්ථික වශයෙන් වර්ධනය කිරීමකි. (......)

(40) ඕනෑම මාධ්‍යයකින් සන්දේශ විසරණය කිරීමෙහිලා ''ප්‍රකාශනයේ නිදහස'' අත්‍යවශ්‍යවේ ඒ අනුව මාධ්‍ය නිදහසට බාධා පැමිණිය හැකි සාධක අයත් කාණ්ඩය වන්නේ,

A - දේශපාලනික සාධක. B - සංස්කෘතික සාධක..

C - සමාජයීය හා සදාචාරාත්මක සාධකයි. D - නෛතික සාධක.

(1) ACD පමණය (2) BCA පමණය

(3) DC පමණය (4) ABC පමණය

(5) ABCD සියල්ලම (......)

(41) ස්වයං නියාමන ප්‍රතිපත්ති යටතට ගැනෙන නියාමන ආයතනය කුමක්ද?

(1) ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය. (2) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

(3) ශ්‍රී ලංකා විදුලි සංදේශනියාමන කොමිෂන් සභාව (4) ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම.

(5) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය. (......)

(42) ජනමාධ්‍ය නියාමයට අයත් වීමේ අවම ඉඩක් ඇත්තේ,

(1) ආචාරධර්ම පද්ධති ස්ථාපනය යි. (2) ලියාපදිංචිකරණ ක්‍රියාවලියයි.

(3) නිසි බලධාරීන් පත්කිරීමයි. (4) අණපනත් සම්පාදනයයි.

(5) ස්වයං වාරණයයි. (......)

(43) මාධ්‍ය නියාමනය නිදහසේ සහ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්මයක් ලෙස සැලකේ. මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාවයට අදාල නොවන ප්‍රකාශය තෝරන්න.

(1) ආර්ථික සම්පත් කළමනාකරණය කිරීම සඳහා නියාමනය අවශ්‍ය වේ.

(2) මහජන සාමය ආරක්ෂා කිරීමට නියාමනය අවශ්‍ය වේ.

(3) පුද්ගල හා සමාජ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා නියාමනය අවශ්‍ය වේ.

(4) සන්නිවේදනයේ නිදහස විවිධත්වය සහ විශ්වීය වටිනාකම් ප්‍රවර්ධනයට නියාමනය වැදගත් වේ.

(5) පාලකයන් ගෙ අත්තනෝමතික ක්‍රියාවන් විවේචනයට ලක් කිරීමට හෝ ඒවාට එරෙහිව නැගී සිටීමට නියාමනය අවශ්‍ය වේ. (......)

(44) යම් කෙනෙකුගේ නිර්මාණයක් සාධාරණ භාවිතයට අදාල නොවන ප්‍රකාශය වන්නේ,

(1) හිමිකම් ආරක්ෂා කර ඇති කාර්යයේ ස්වභාවය.

(2) වෙළෙඳපොළ සඳහා භාවිත කිරීම සඳහා ඇති බලපෑම.

(3) භාවිත කරනු ලබන කාර්යය ප්‍රමාණය.

(4) කොටස් හිමිකම සහ අයිතිය වෙනුවෙන් ගෙවීම.

(5) භාවිතය හා එහි ස්වභාවය. (......)

(45) ශ්‍රී ලාංකීය සන්නිවේදනය සම්බන්ධයෙන් සත්‍ය නොවන වරණය වන්නේ,

(1) 1815 වන විටත් සන්නිවේදන ජාලය රජු වටා බැඳී තිබුණි.

(2) ඉංග්‍රීසි ජාතියට මෙරට යටත් වීමෙන් පසු කිතුනු ආගමික බලයට යටත් විය.

(3) 1734 දී ඕලන්ද පරිපාලනය විසින් නිල නිවේදන සිංහලයෙන් පළ කරන ලදී.

(4) පූර්ව යටත් විජිත සමය වන විටත් සන්නිවේදන ජාලය බෞද්ධ ආගම කේන්ද්‍රීය පැවතින.

(5) 1861දී ලංකා ලෝකය පුවත්පත පළ විය (......)

(46) පහතින් දක්වා ඇති නවකතා අතරින් පියදාස සිරිසේන මහතාගේ නවකථාවක් වන්නේ,

(1) වහල්ලු. (2) අම්මා (3) රොසලින් හා ජයතිස්ස.
(4) සිරිසඟබෝ (5) වීර වික්‍රම. (......)

(47) 1948.1979.1982 යන වර්ෂයන්හි දී ශ්‍රී ලාංකීය සන්නිවේදනය හා සම්බන්ධ වැදගත් සිදුවීම් සිදුවිය. එය නිවැරදිව ගැළපූ විට අදාල වරණය තෝරන්න,

(1) නිදහස ලැබීම / ස්වාධීන රූපවාහිනී නාලිකාව ආරම්භය / ජාතික රූපවාහිනියේ ආරම්භය.

(2) කඩවුණු පොරොන්දුව චිත්‍රපටය තිරගත වීම / ස්වාධීන රූපවාහිනී නාලිකාව ආරම්භය / ජාතික රූපවාහිනියේ ආරම්භය.

(3) රේඛාව චිත්‍රපටය තිරගත වීම / ජාතික රූපවාහිනය ආරම්භය / ලක් හඬ ගුවන්විදුලි ආරම්භය.

(4) ගුවන්විදුලි ආරම්භය / ලක්මිණි පහන පුවත්පත ප්‍රකාශයට පත්වීම / ලංකාලෝකය පුවත්පත ප්‍රකාශයට පත්වීම.

(5) ජාතික චිත්‍රපට අංශය ආරම්භය / ස්වාධීන රූපවාහිනී නාලිකාව ආරම්භය / ජාතික රූපවාහිනී ආරම්භය. (......)

(48) පහතින් දක්වා ඇත්තේ සමීක්ෂණයක් යනු කුමක්දැයි අසා තිබූ ප්‍රශ්නයට ළමුන් කිහිප දෙනෙක් ඉදිරිපත් කළ අදහස් කිහිපයකි.

A - සමීක්ෂණ යනු පරීයේෂණයකි

B - සමීක්ෂණය යනු පරීයේෂණ විධි ක්‍රමයකි.

C - සමීක්ෂණය මගින් ප්‍රාථමික දත්ත ඒකරාශී කිරීමක් සිදුවේ.

D - සමාජ තත්ත්වයක් හෝ සමාජ ප්‍රශ්නයක් ක්‍රමවත් හා විධිමත් ව විග්‍රහ කිරීමේ ක්‍රමයයි.

ඉහත ප්‍රකාශ අතරින් වැරදි පිළිතුර වන්නේ,

(1) D හා C ය (2) C හා B ය (3) A පමණි.
(4) B පමණි. (5) C පමණි. (......)

(49) සමීක්ෂණ ක්‍රියාවලියේ දී පිළිපැදිය යුතු ආචාර ධර්මයක් නොවන්නේ,

(1) නිවැරදි සමීක්ෂණ ක්‍රමවේද භාවිතය.
(2) දත්ත දායකයාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම..
(3) දත්ත දායකයාට නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම.
(4) දත්ත හිතාමතා විකෘති නොකිරීම.
(5) වැරදි දත්ත ඇතුළත් කිරීම. (......)

(50) සමීක්ෂණ වාර්තාවක මූලාශ්‍ර ඇතුළත් කළ යුත්තේ Harvard හෝ APAක්‍රමවේදයන්ට අනුව ය. එසේ සටහන් කර ඇති නිවැරදි නිදසුන් වන්නේ,

(1) දිසානායක විමල් (1977) මානව සංනිවේදනය, සී/ස ලේක්හවුස් සමාගම, කොළඹ.
(2) විමල් දිසානායක(1977) මානව සන්නිවේදනය, සී/ස ලේක්හවුස් සමාගම, කොළඹ.
(3) මානව සන්නිවේදනය, විමල් දිසානායක,1977 සී/ස ලේක්හවුස් සමාගම, කොළඹ.
(4) 1977, සී/ස ලේක්හවුස් සමාගම, කොළඹ, මානව සන්නිවේදනය, විමල් දිසානායක.
(5) දිසානායක, විමල්, මානව සන්නිවේදනය, සී/ස ලේක්හවුස් සමාගම, කොළඹ. (......)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 13 - 2023**

විභාග අංකය: ..................................

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

කාලය පැය 03 යි

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

- උපදෙස් :- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

01. 'සන්නිවේදනය විවිධ අංග ලක්ෂණ වලින් සමන්විත සංකීර්ණ ක්‍රියාවලියකි'

(i). පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවයකදී දැකගත හැකි නිර්වාචික සන්නිවේදන විධික්‍රම හතරක් නම් කරන්න. (ල. 04)

(ii) සමූහ සන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)

(iii) විධිමත් සන්නිවේදනයට සාපේක්ෂව අවිධිමත් සන්නිවේදනයේ වාසි තුනක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න (ල. 12)

(iv) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය අන්තර්ගතයෙහි ඇති වී ඇති නව ප්‍රවණතා හතරක් උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ල.16)

02. (i) අග්නිදිග ආසියාවේ ප්‍රථම ගුවන්විදුලි සේවය බිහි වන්නේ කුමන රටේද? (ල. 02)

(ii) ''තුන්වන ලෝකයේ රටවල් සංවර්ධනය කිරීමට ගුවන් විදුලි මාධ්‍යය සාර්ථක ක්‍රමවේදයකි.'' කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න (ල. 08)

(iii) සංවර්ධන සන්නිවේදන ප්‍රවේශ තුනක් විස්තර කරන්න. (ල. 12)

(iv) පහත සඳහන් මාධ්‍ය නියාමන ආයතන වල කාර්යයන් පිළිබඳ විස්තර කරන්න.

(අ) ප්‍රසිද්ධ රූගුම් පාලක මණ්ඩලය.

(ආ) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය.

(ඇ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව.

(ඉ) පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය. (ල. 16)

03. (i) සමීක්ෂණයක දී ප්‍රශ්නාවලියකින් හෝ සම්මුඛ සාකච්ඡාවක් මගින් ලබාගන්නා 'දත්ත' හැඳින්වෙන්නේ කුමන නමකින්ද? (ල. 04)

(ii) සමීක්ෂණ භාවිතයේ වාසි දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)

(iii) 'තරුණ පරපුර හා මත්ද්‍රව්‍ය භාවිතය' යන මැයෙන් දේශනයක් පාසල තුළ සංවිධානය වී තිබුණි .ඔබ මෙහි ග්‍රාහක යෙකු ලෙස ඔබට ඉටුකර ගත හැකි සන්නිවේදන අරමුණු තුනක් පැහැදිලි කරන්න. (ල. 12)

(iv) සාම්ප්‍රදායික මාධ්‍යයේ පහත ලක්ෂණ උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

(අ) සරල ව්‍යුහය.

(ආ) තේමාත්මක අන්තර්ගතය.

(ඇ) නම්‍යශීලිත්වය.

(ඉ) සංස්කෘතික සන්දර්භය. (ල. 16)

04 (i) දෘශ්‍ය සන්නිවේදන කුසලතා හතරක් නම් කරන්න. (ල. 04)

(ii) ලැස්වෙල් සන්නිවේදන ආකෘතිය හා ග්‍රාම් ඔස්ගුඩ් සන්නිවේදන ආකෘතිය අතර පවත්නා වෙනස්කම් දෙකක් සංසන්දනාත්මකව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)

(iii) මාධ්‍ය විචාරය හා සම්බන්ධ පහත විවිධතා නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(අ) මාධ්‍ය හා දෛනික ජීවිතය..

(ආ)මාධ්‍ය සංදේශ ආධිපත්‍යය.

(ඇ)මාධ්‍ය ආර්ථිකය (ල. 12)

(iv) පුවත්පත් අන්තර්ගතයේ ඇති පහත නිර්මාණාත්මක ආකෘති සුදුසු නිදසුන් ලබාදෙමින් පහදන්න

(අ) ප්‍රවෘත්ති

(ආ) සංස්ලේඛය

(ඇ) කාටූන්

(ඉ) තීරු ලිපි (ල. 16)

05. (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සන්නිවේදන හිමිකම පිළිබඳ දක්වා ඇති වගන්තිය ලියා දක්වන්න.(ල. 04)

(ii) සංවර්ධනය වෙමින් පවතින රටවලට සංවර්ධන සන්නිවේදන අපේක්ෂාවන් වැදගත් වේ. එවැනි සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.(ල. 08)

(iii) පරම්පරාවෙන් පරම්පරාවට අධ්‍යාපනය ලබාදීමේ උපක්‍රමයක් ලෙස ජන කතා යොදා ගැනීමේ වැදගත්කම කරුණු තුනක් මගින් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 12)

(iv) ගෝලීය සංස්කෘතිය ශ්‍රී ලංකා සමාජය වෙනස් කර ඇත. කරුණු 04ක් මගින් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල. 16)

06. (i) ජනමාධ්‍ය පිළිබඳ ඩිෆ්ලුවර් හා ඩෙනිස් විසින් ඉදිරිපත් කර ඇති නිර්වචනය ලියා දක්වන්න(ල. 04)

(ii) මැතිවරණ කාල සීමාවකදී මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)

(iii) ඩබ්. ජේම්ස් පෝටර් ට අනුව උසස් මාධ්‍ය සාක්ෂරතාවයක්' ලබා ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන 03ක් විස්තර කරන්න. (ල. 12)

(iv) සිද්ධි කළමනාකරුවෙකුගේ කාර්යභාරය කරුණු 04ක් මගින් පැහැදිලි කරන්න. ( ල. 16)

07. (i) මාධ්‍ය ආචාර ධර්ම සංග්‍රහ වල දී අවධානය යොමු කරන ප්‍රධාන වගන්ති 04ක් නම් කරන්න.(ල. 04)

(ii) පුද්ගලයෙකු සමාජානුයෝජනය වන ආකාර 02ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)

(iii) සමීක්ෂණයකදී දත්ත රැස් කිරීමට ප්‍රශ්නාවලි ක්‍රමයට වඩා සම්මුඛ සාකච්ඡා ක්‍රමය වාසිදායකය. කරුණු 03ක් මගින් පැහැදිලි කරන්න. (ල. 12)

(iv) ''සිනමා මාධ්‍ය ප්‍රබල කලා මාධ්‍යයකි.'' සිනමාවේ මූලික ලක්ෂණ 04 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 16)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved



වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**තෙවන වාර පරීක්ෂණය - 2023**

**13 ශ්‍රේණිය** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය** **පිළිතුරු පත්‍රය**

සැලකිය යුතුයි

* ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න හතකි. ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු 40 බැගින් ලකුණු 200 කි. (II පත්‍රය සඳහා මුළු ලකුණු = 5 x 40 = 200)

අවසාන ලකුණු ගණනය කිරීම: I පත්‍රය (1 x 50) = 50

II පත්‍රය (5 x 40 = 200, 200 ÷ 4 ) = 50

අවසාන ලකුණු = 100

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(3) | 3 -(1) | 4 -(5) | 5 -(5) | 6 -(1) | 7 -(2) | 8 -(4) | 9 -(2) | 10 -(3) |
| 11 -(2) | 12 -(4) | 13 -(4) | 14 -(2) | 15 -(2) | 16 -(4) | 17 -(3) | 18 -(3) | 19 -(2) | 20 -(3) |
| 21 -(3) | 22 -(5) | 23 -(4) | 24 -(1) | 25 -(5) | 26 -(2) | 27 -(5) | 28 -(1) | 29 -(1) | 30 -(4) |
| 31 -(2) | 32 -(3) | 33 -(4) | 34 -(1) | 35 -(4) | 36 -(1) | 37 -(1) | 38 -(4) | 39 -(3) | 40 -(5) |
| 41 -(4) | 42 -(5) | 43 -(5) | 44 -(4) | 45 -(5) | 46 -(3) | 47 -(2) | 48 -(3) | 49 -(5) | 50 -(1) |

## II කොටස

01. (i) නිවාස ධජ / නිවාස කුටි / ක්‍රීඩා පිටිය / පිළිගැනීමේ තොරණ.
ඔලිම්පික් පහන ආදී ක්‍රීඩා උත්සවයකට ගැලපෙන ආකාරයෙන් විවිධ ක්‍රම වලට ලකුණු ලබා දෙන්න
(ලකුණු 1 ×4 =04)

(ii) සමාජීය පොදු පොදුකාර්ය වලදී ඉවහල් වීම.
- විවිධ මතිමතාන්තර අදහස් හා යෝජනා දැනගැනීමට හැකිවීම.
- පුද්ගල සන්නිවේදන කුසලතා වර්ධනය කරගැනීමට අවස්ථාව සැලසීම.
- සහභාගීවන පි වන පිරිස ගෙන් ප්‍රතිචාර සහ ප්‍රතිපෝෂණ ලබා ගැනීමට හැකි වීම
- දැනුම සම්පත් ආදිය බෙදා ගැනීමේ හැකියාව.

ඉහත ප්‍රයෝජන වලින් ප්‍රයෝජන 02 ක් ප්‍රමාණවත් පරිදි පැහැදිලි කර තිබේ නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න (ලකුණු 2 ×4 =08)

(iii) වේගයෙන් පැතිරීම.
ජනතාවගේ හැගීම් ආකල්ප විරෝධතා ඉදිරිපත් කළ හැකිවීම.
කාලයක් ස්ථානයක් වෙලාවක් නොමැති වීම.
නව මාධ්‍ය භාවිතයෙන් ආකර්ෂණීය ලෙස සිදු කළ හැකි වීම.
(නිදසුන් සහිතව පැහැදිලි කර ඇත්නම් ලකුණු 4 x 3 = 12)

(iv) සරල භාෂා භාවිතය.
වෙළඳ දැන්වීම් ප්‍රමාණාත්මකව ඉහළ යාම.
ඉදිරිපත් කිරීමේ නව මාදිලි යොදාගැනීම.
විනෝදාස්වාදය කෙරෙහි වැඩි අවධානයක් දැක්වීම
යනාදී කරුණු සුදුසු උදාහරණ සමගින් පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න
(ලකුණු 4 x 4 = 16)

02. (I) ශ්‍රී ලංකාව (ල. 04)

(ii) සරල භාෂා භාවිතය.
සාක්ෂරතාවක් අවශ්‍ය නොවීම
ක්ෂණික මාධ්‍යයක් වීම්
අදාළ කරුණු දෙකක් පැහැදිලි කර ඇත්නම්. (ලකුණු 4 x 2 = 08)

(iii) හැසිරීම් වෙනස්කම් සඳහා සන්නිවේදනය.
සමාජයීය වෙනස්කම් සඳහා සන්නිවේදනය.
නියාමනය සඳහා සන්නිවේදනය.
පාරිසරික සමතුලිතතාවය සඳහා සන්නිවේදනය
ඉහත කරුණු 3 විස්තර කිරීමට. (ලකුණු 4 x 3 = 12)

(iv) අ - චිත්‍රපට වලට සහතික නිකුත් කිරීම. (X,U,A)
සන්දර්ශන /වෙළඳ දැන්වීම්/ වේදිකා නාට්‍ය පිටපත් / ටෙලි නාට්‍ය පිටපත් ආදිය සම්බන්ධව සොයා බැලීම.

ආ - පුවත්පත්වල වෘත්තීය තත්ත්වය ඉහළ දැමීම.
පුවත්පත් නිදහස ආරක්ෂා කිරීම.
පුවත්පත් ආචාරධර්ම පවත්වාගෙන යාම.
ආචාර ධර්ම කඩ කිරීම පිළිබඳ පැමිණිලි විභාග කිරීම.

ඇ - ගුවන්විදුලි හා රූපවාහිනී විකාශය සඳහා සංඛ්‍යාත පද්ධති බෙදා දීම.
ජංගම දුරකථන භාවිතයේදී ග්‍රාහකයන්ට මතු වන ගැටළු, පැමිණිලි භාර ගැනීම.
මහජන අයිතීන් ආරක්ෂා කිරීම.

ඉ - මූල්‍ය හා වෙනත් අපරාධ පිළිබඳ දැනුවත් කිරීම.
ත්‍රස්තවාදී සංවිධාන වල ක්‍රියාකාරීත්වය එරෙහිව දැනුවත් කිරීම.
පරිගණක ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් මහජන පැමිණිලි විමර්ශනය කිරීම හා විසඳුම් ලබාදීම.
ඉහත ආයතන වලට අදාලව කාර්යයන් දෙකක්වත් තිබේ නම් පූර්ණ ලකුණු ලබා දෙන්නී

(ලකුණු $4 x 4 = 16$)

03. (i) අමු දත්ත (ල. 04)

(ii) කෙටි කාලයක් තුළදී දත්ත රැස් කරගත හැකි වීම
දත්ත දායකයින් විශාල ප්‍රමාණයකින් වුවද තොරතුරු රැස් කරගත හැකි වීම.
සමීක්ෂණ දුරස්ථව මෙහෙයවීමට හැකි වීම.
මෘදුකාංග භාවිතයෙන් තොරව මෙන්ම භාවිතා කරමින් දත්ත රැස් කරගත හැකි වීම.
ආදී කරුණු 02 ක් කෙටියෙන් පැහැදිලි කර ඇත්නම් (ලකුණු $4 x 2 = 8$)
(13 ශ්‍රේණිය-ගුරු මාර්ගෝපදේශය-110 පිටුව)

(iii) තොරතුරු සම්පාදනය.
උපදෙස් සම්පාදනය /අධ්‍යාපනය ලබාදීම
විනෝදාස්වාදය .
පෙළඹවීම.
යන කරුණු දේශනය ඇසුරෙන් පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න(ලකුණු $4 x 3 = 12$)

(iv) (අ) සරල ව්‍යුහය -
- සාමාන්‍ය ජනයාට අවබෝධ කර ගත හැකි වීම
- අවට පරිසරයෙන් පහසුවෙන් සපයා සපයා ගත හැකි අමුද්‍රව්‍ය වලින් ගොඩනගා ගැනීම.

(ආ)තේමාත්මක අන්තර්ගතය -
- තේමාවන්ට ගැලපෙන ලෙස සකස් කෙරේ.
- උදාහරණ මගින් පැහැදිලි කර තිබීම.
ලෙඩ රෝග වලින් ආරක්ෂා වීම.
නවබෝග ආරක්ෂා කිරීම්
විනෝදයට
විශ්‍රාන්තියට

(ඇ)නම්‍යශීලීත්වය - අවස්ථාවට හා අවශ්‍යතාවයට ගැලපෙන ආකාරයට පහසුවෙන් සකස් කර ගත හැකි වීම.
උදාහරණ - කමත කුඹුර.

(ඉ)සංස්කෘතික සන්දර්භය - අදාල සංස්කෘතියට ගැළපෙන ආකාරයට චාරිත්‍ර වාරිත්‍ර ඇදහිලි විශ්වාසයන් සිදුකිරීමයි.
අදාළ කරුණු සමගින් ගුණාත්මක ලෙස පිළිතුර තිබේ නම් එක් කරුණකට(ලකුණු $4 x 4 = 16$)

04 (i) රූප මැනවින් දැකීම
රූප හඳුනාගැනීම.
අධ්‍යාපනික කාර්යය සඳහා රූප භාවිතයට ගැනීම.
දෘශ්‍ය සන්නිවේදන අංග යොදා ගනිමින් නිර්මාණ කිරීම.

(කරුණු 4 ම නම් කර ඇත්නම් $1 x 4 = 4$)

(ii)

| **ලැස්වෙල්** | **ශ්‍රාම් ඔස්ගුඩ්** |
|---|---|
| රේඛීය ආකෘතියකි | රේඛීය නොවන ආකෘතියකි. |
| සන්නිවේදකයා පිළිබඳ වැඩි අවධානයක් යොමු කරයි. (සන්නිවේදක කේන්ද්‍රය වේ) | සන්නිවේදකයා - ග්‍රාහකයා පිළිබඳ වැඩි අවධානයක් යොමු කරයි |
| බලපෑම් පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම. | ප්‍රති පෝෂණය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම. |
| සන්නිවේදනය ක්‍රියාවලියක් බව නොපෙන්වයි. | සන්නිවේදනය අඛණ්ඩ ක්‍රියාවලියක් බව පෙන්වා දෙයී |

කරුණු02 සංසන්දනාත්මකව පැහැදිලිකර ඇත්නම් (ලකුණු $4 x 2 = 8$)

(iii) (අ) මාධ්‍ය හා දෛනික ජීවිතය.

- එදිනෙදා ජීවිතයේ වැඩි කාල පරාසයක් හරසුන් වැඩසටහන් නැරඹීමට යොමුවීම.
- සංදේශ වල ගුණාත්මකභාවය කෙරෙහි අවධානය යොමු නොකරයි.
- ක්ෂණික ආහාරපාන වලට යොමු වීම.

(ආ)මාධ්‍ය හා සංදේශ ආධිපත්‍යය.

- සමාජ සංස්කෘතිය කෙරෙහි චින්තනය කෙරෙහි මාධ්‍ය බලය පැතිරවීම මාධ්‍ය ආධිපත්‍යයයි.
- එනම් මාධ්‍යයට අනුව අපි හැසිරීමයි
- දේශපාලනික හා ව්‍යාපාරික ප්‍රජාව විසින් මාධ්‍ය මෙහෙයවීම.

(ඉ) මාධ්‍ය ආර්ථිකය

- මාධ්‍ය කර්මාන්තය මත ගොඩනැගුණකි.
- වෙළඳ දැන්වීම් කරුවන්, ග්‍රහකයා හා මාධ්‍ය අතර සම්බන්ධතාවයක
- සන්නිවේදන පද්ධති මගින් වෙළෙඳපොළ සඳහා යටිතල පහසුකම් සපයයි.

ඉහත කරුණු ඇතුළත්ව විස්තර කර ඇත්නම්. (ලකුණු $4 \times 3 = 12$)

(iv) නිවැරදි ලෙස ප්‍රමාණාත්මක ලෙස පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. ( $4 \times 4 = 16$)

05. (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) වගන්තිය.

සෑම පුරවැසියෙකුටම - භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළකිරීමේ නිදහස අයත්ය. (ලකුණු 04)

(ii) අවශ්‍යතා කේන්ද්‍රීයත්වය.

ස්වයං නිරීක්ෂණය

ස්වයං විස්වාසය

යහපත් පරිසරයක් ගොඩනැගීම

සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය.

ඉහත කරුණුවලින් 2 ක් නිවැරැදිව පැහැදිලි කර ඇත්නම්. (ලකුණු $4 \times 2 = 8$)

(iii) දැනුම් ඉගෙනුම් සම්පාදනය..

උපදේශාත්මක සන්දේශ ජනනය කළ හැකි වීමයි.

සංස්කෘතික අංග හුවමාරු කිරීමට හැකිවීම.

විනෝදාස්වාදය

අහිතකර සමාජ ප්‍රවණතා විවේචනයට ලක් කිරීමයි.

එක් කරුණක් පැහැදිලි කිරීමට. (ලකුණු $4 \times 3 = 12$)

නිදසුන් අනිවාර්යෙන්ම තිබිය යුතුය. නිදසුන් නොමැතිනම් සම්පූර්ණ ලකුණු හිමි නොවේ.

(iv) අධ්‍යාපනය - විද්‍යාව හා තාක්ෂණය මත පදනම් වූ පාඨමාලා බහුලව හැදෑරීම.
පෞද්ගලික විශ්ව විද්‍යාල.
විදේශගතවීම්.

සන්නිවේදනය - ග්‍රහක ක්ශේත්‍රය ප්‍රසාරණය වීම.
අන්තර්ජාල භාවිතය වැඩි වීම.
සංඛ්‍යාත්මක නාලිකා වැඩිවීම.
වැඩසටහන ආකෘති වෙනස් වීම.

ආර්ථිකය - සංචාරය හා සංක්‍රමණය අධිකවීම.
බහු ජාතික ව්‍යාපාර ඉදිරියට පැමිණීම.
පෞද්ගලික මූල ධනය ගලා යාම.
ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා.

සංස්කෘතිය - ආහාර පාන
විලාසිතා.
සිරිත් විරිත්.

තාක්ෂණය - තාක්ෂණය සරල වීම
භාවිතය පහසු වීම (තාක්ෂණිකඋපකරණ)

ආදී කරුණු 04ක් විස්තර කිරිම.

නිදසුන් අනිවාර්ය. (ලකුණු $4 \times 4 = 16$)

06. (i) 'ජන සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා කාලය හා දුර හා අතර සංදේශ හුවමාරු කර ගැනීමට' යොදනු ලබන උපාංග ජනමාධ්‍යයි' (ලකුණු 4 x1 = 4)

(ii) කිසියම් අරමුණක් සඳහා ජන සමූහයක් පොළඹවා ගැනීමට හැකිවීම.
ප්‍රස්තුත කරුණු පිළිබඳ වැඩිදුර දැනුවත් කිරීමක් සිදු කිරීම සඳහා යොදා ගැනීමට හැකිවීම.
ප්‍රතිරූප ගොඩ නංවා ගැනීමට උපකාර වීම.
කිසියම් මතයක් නිර්මාණය කිරීමට හේතු වීම.
විවිධ පාර්ශවවල අවධානය දිනා ගැනීමට හැකි වීම
කෙටියෙන් පැහැදිලි කිරීමට (ලකුණු 4 x2 = 8)

(iii) විවිධ මාධ්‍ය සංදේශ ලබා ගැනීමේ කැමැත්ත වැඩි වීම.
මානසික චර්යා පද්ධතිය පාලනය කර ගැනීමේ හැකියාව.
විවිධ මාධ්‍ය සංදේශ වඩාත් විචක්ෂණශීලීව උකහා ගැනීමේ පරිචය ලබාගැනීම.
යන කරුණු පැහැදිලි කිරීමට. (ලකුණු 4 x3 = 12)

(iv) සිද්ධි තේමාව ඉලක්කය හඳුනා ගැනීම
සැලසුම් කිරීම.
මූල්‍ය පිරිවැය හා එය සැලසුම් කිරීම.
නිර්මාණශීලීත්වය.
ඉලක්ක කණ්ඩායම් හඳුනාගැනීම.
පාරිභෝගික සේවා සැලසුම්.
හදිසි අවස්ථා කළමනාකරණය
ආරක්ෂාව පිළිබඳ අවධානය යොමු කිරීමයි.
පිටපත ලිවීම
ස්ථානයක් වෙන් කර ගැනීම.
කාර්යයන් සංවිධානය
ආදී කරුණු 04ක් විස්තර කර ඇත්නම් එකකට (ලකුණු 4 x 4 = 16)

07. (i) නිවරද්‍යතාවය.
පෞද්ගලිකත්වය.
මූලාශ්‍ර හෙළි නොකිරීම.
පිළිතුරු දීමේ අයිතිය. (ලකුණු 1 x 4 = 4)

(ii) අනුකරණ
තදාත්මීකරණය.
භූමිකා නිරූපණය.
නිවැරදි ලෙස ප්‍රමාණවත් ලෙස විස්තර කර තිබේ නම් එක් කරුණකට. (ලකුණු 4 x 2 = 8)

(iii) කිසියම් ප්‍රශ්නයකට අදාල පිළිතුර හෝ තොරතුර ලබා දෙන්නාගෙ වචනවලින් ලබාගැනීමට හැකි විම.
සාකච්ඡාවක් පවත්වන මොහොතේදී දත්ත දායකයාගේ ප්‍රතිචාර අනුව නව ප්‍රශ්න එකතු කිරීම හා පැවැති ප්‍රශ්න සංශෝධනය කළ හැකිය.
සම්මුඛ සාකච්ඡා මෙහෙයවන්නා හා ප්‍රතිචාර දක්වන්න අතර පමණක් සාකච්ඡාව සිදුවීම ඵලදායක.
අසන ප්‍රශ්න වලට පිළිතුරු ලබාදීමට අමතරව දත්ත දායකයා නිරීක්ෂණය කිරීමෙන් ඔහුගේ සිතුවිලි, හැඟීම්, ක්‍රියාකාරකම්,ආකල්ප මතය වැනි දේ පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිවීම.
සාකච්ඡාවට බඳුන් වන්නා සමඟ සුහදතාව වර්ධනය කරගැනීමෙන් සාකච්ඡාවක් පවත්වා ගෙන යාම.
(ලකුණු 4 x 3 = 12)

(iv) අඳුර සමග මුසු වූ මාධ්‍යයකි.
තිව්‍ර හඬ විශාල තිර භාවිත කෙරේ.
ප්‍රබන්ධමය ස්වරූපයේ සංදේශ සහිත ය.
පෞද්ගලිකව අභිමතය පරිදි නරඹන මාධ්‍යයකි.
සංදේශ බාධාවලින් තොරව නැරඹිය හැකිය.
(කලා මාධ්‍යයක් වීමට හේතු දක්වා තිබිය යුතුය.) (ලකුණු 4 x 4 = 16)